# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1823/42 - 2013 අගෝස්තු මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2013.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා. කා. අංකය : සීඑස්ජී/7/8/15.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මහින්ද රාජපක්ෂ

1. මැක්ස්වෙල් පරාක්‍රම පරණගම මැතිතුමා
2. දිමින්ගු බඩතුරුගේ ප්‍රියන්ති සුරංජනා විද්‍යාරත්න මැතිතුමිය
3. මනෝ රාමනාදන් මැතිතුමිය

වෙත,

ශුභාශිංසන පෙරටුවයි !

දෙවන ඊලම් යුද්ධය ආරම්භ වූ 1990 ජුනි මස 10 දින සිට එකී යුද්ධයේ නිමාව සටහන් කරන ලද 2009 ක් වූ මැයි මස 19 දින දක්වා කාල පරිච්ඡේදය තුළ අවාසනාවන්ත සිදුවීම් වලට භාජනය වූ ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර දෙපළාතේ පදිංචිව සිටි ඇතැම් තැනැත්තන් ඔවුන් පදිංචිව සිටි ස්ථාන වලින් සිය කැමැත්තෙන් තොරව ඉවත්කොට ගෙන යනු ලැබූ බවට හෝ, ඒ තැනැත්තන් ඔවුන් පදිංචිව සිටි ස්ථානවලින් අතුරුදහන් වී ඇති බවටත්, එසේ ඉවත්කොට ගෙන යනු ලැබුවේ යැයි හෝ අතුරුදහන් වූවේ යැයි කියනු ලබන තැනැත්තන් කවර තැනක සිටින්නේදැයි යන්න දැනගැනීමට නොමැති බවටත් පැමිණිලි ලැබී ඇති හෙයින්ද,

තවද, ඉහත කී පැමිණිලි වල සත්‍ය අසත්‍යතාවය නිසැකව දැන ගැනීමටත්, එකී පැමිණිලි සත්‍ය වන්නේ නම් ; එලෙස ඉවත් කරනු ලැබූ හෝ අතුරුදහන් වූවේ යැයි කියනු ලබන තැනැත්තන් කවුරුන්ද යන්නත් හඳුනා ගැනීමටත් අවශ්‍යව ඇති හෙයින්ද,

තවද, එකී ඉවත් කරනු ලැබීම් හෝ අතුරුදහන්වීම් වලට වගකිවයුතු තැනැත්තකු හෝ තැනැත්තන් කවුරුන්ද යන්න හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් එකී තැනැත්තකු හෝ තැනැත්තන්ට විරුද්ධව නීත්‍යානුකූල පියවර ගැනීමටත් අවශ්‍යව ඇති හෙයින්ද,

තවද, එවන් ක්‍රියා අනාගතයේදී සිදුවීම වැළැක්වීම සඳහා කවර පියවර ගතයුතුදැයි යන්න නිශ්චය කිරීම පිණිස පරීක්ෂණ පැවැත්වීම මහජන ආරක්ෂාවට සහ ශුභසිද්ධියට හේතු වන බව මගේ මතය වන හෙයින්ද,

මෙහි මින්මතු සඳහන් කරනු ලබන කරුණු පිළිබඳව විමර්ශනයක් පවත්වා වාර්තා කිරීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍යයැයි මා හට පෙනී යන හෙයින්ද,


1A - G 018132 — 160 (2013/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www. documents.gov. lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍යය, ස්වාධීනතාව සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් (393 වැනි අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (2) වැනි වගන්තියෙහි විධිවිධානයන්ට අනුකූලව ඉහත කී :

1. මැක්ස්වෙල් පරාක්‍රම පරණගම මැතිතුමා
2. දිමින්ගු බඩතුරුගේ ප්‍රියන්ති සුරංජනා විද්‍යාරත්න මැතිතුමිය
3. මනෝ රාමනාදන් මැතිතුමිය

වන ඔබතුමන්ලා, මතු දැක්වෙන කරුණු පිළිබඳව, එනම් :

(අ) 1990 ජුනි මස 10 දින සිට 2009 මැයි මස 19 දක්වා උතුරු හා නැගෙනහිර දෙපළාතේ පදිංචිව සිටි යම් තැනැත්තන් සිය කැමැත්තෙන් තොරව පදිංචි ස්ථාන වලින් ඉවත් කරගෙන යනු ලැබ හෝ අතුරුදහන් වී ඇත්ද යන වග ;

(ආ) එසේ ඉවත්කරගෙන යනු ලැබූ බවට හෝ අතුරුදහන් වූ බවට ඔප්පු කිරීමට පවත්නා සාක්ෂි ;

(ඇ) එසේ ඉවත් කරනු ලැබූ හෝ අතුරුදහන් වූ පුද්ගලයන් කවුරුන්ද සහ එකී පුද්ගලයින් දැනට සිටින ස්ථාන ;

(ඈ) ඉහත කී ඉවත් කරනු ලැබීම් හෝ අතුරුදහන් වීම් වලට වගකිව යුතු තැනැත්තෙකු හෝ තැනැත්තන් පිළිබඳ අදහසක් ඇති කර ගැනීමට සමත් විශ්වාසනීය කරුණු හෝ සාක්ෂි ;

(ඉ) එසේ වගකිව යුතුයැයි නිශ්චය කෙරෙන තැනැත්තෙකු හෝ තැනැත්තන්ට විරුද්ධව ගනු ලැබිය හැකි නීතිමය ක්‍රියාමාර්ග ;

(ඊ) එවැනි ක්‍රියා අනාගතයේදී සිදුවීම වැලැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ;

(උ) එසේ ඉවත් කරගෙන යනු ලැබූවේයැයි හෝ අතුරුදහන් වූවේයැයි කියනු ලබන තැනැත්තන්ගේ දෙමව්පියන්ට, කලත්‍රයන්ට සහ යැපෙන්නන්ට රජයේ වගකීමක් ලෙස සැලසිය යුතු සහන කිසිවක් තිබේ නම් එකී සහන ;

පරීක්ෂා කොට, වාර්තා කරනු පිණිස මගේ කොමසාරිස්වරුන් ලෙසින් මෙමගින් පත් කරමි.

තවද, පූර්වෝක්ත කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් ඉහත කී මැක්ස්වෙල් පරාක්‍රම පරණගම වන ඔබ මම මෙයින් පත් කරමි.

තවද, පෙරකී කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි යැයි ඔබට පෙනී යන එබඳු සියලු පරීක්ෂණ පැවැත්වීමට ද එබඳු සියලු විමර්ශනයන් කිරීමට ද ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබතුමන්ලාට මා මෙයින් මගේ බලය හා අධිකාරය පවරන අතර, මේ අධිකාරි පත්‍රයෙහි දින සිට හය මසක් ඇතුළත ඔබේ පරීක්ෂණයන්හි නිගමනයන් හා ඒවාට අදාළ ඔබේ නිර්දේශයන් ඇතුළත් වාර්තාවක් ඔබේ අත්සනින් මා වෙත ඉදිරිපත් කරන මෙන් ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, පූර්වෝක්ත කාරණාවලට අදාළ වන කිසියම් පරීක්ෂණයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබේ අභිමතය පරිදි නිශ්චය කරනු ලැබේ නම් එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතුයැයි මම ඔබට නියම කරමි.

තවද, ඔබගේ පරීක්ෂණයන්හි හෝ විමර්ශනයන්හි කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් තත් කාර්යය සඳහා නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලුම සහාය දිය යුතු යැයි ද, සපයනු ලැබිය හැකි සියලුම තොරතුරු සැපයිය යුතු යැයි ද මෙයින් නියම කොට විධාන කරමි.

තවද ඉහත කී පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 14 වන වගන්තියෙහි විධිවිධාන මෙම කොමිෂන් සභාවට අදාළ විය යුතු බව මම මෙයින් ප්‍රකාශ කරමි.

වර්ෂ දෙදහස් දහතුනක් වූ අගෝස්තු මස 12 වැනි දින වන මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

08 - 1021

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.